පේරාදෙණිය විශ්වවිද්‍යාලය,ශ්‍රී ලංකාව
பேராதனைப் பல்கலைக்கழகம், இலங்கை
**UNIVERSITY OF PERADENIYA, SRI LANKA**
Student Accommodation Division

යොමුව :A/D - 01

| ලියාපදිංචි අංකය : |
|---|

.............................................................................................. හිමි/මයා/මෙය

**1. නේවාසික පහසුකම් ලබා ගැනිම.**

ඉහත සඳහන් කරුණට අදාළව 2021/22 අධ්‍යයන වර්ෂය සඳහා නේවාසික පහසුකම් ලබාගැනීම පිණිස ඉදිරිපත් කරන ලද අයදුම්පත අනුව ........................................................ දින සිට ක්‍රියාත්මක වන පරිදි නේවාසික පහසුකම් සැපයීම සඳහා ඔබ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ.......................................................... ශාලාවට අනුයුක්ත කොට ඇති බව සතුටින් දන්වා සිටිමි. ඒ අනුව එදින පෙරවරු 8.00 සිට පස්වරු 6.00 දක්වා කාලය තුලදී ඉහත කී ශාලාවේ ශාලාධිපති/උප ශාලාධිපති වෙත වාර්තා කොට නේවාසික පහසුකම් ලබාගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

- නේවාසිකාගාරයට පැමිණීමට පෙර මෑතකදී ඔබ බෝවන රෝගයකින් පෙළුනේ නම් හෝ එවැනි රෝගියකු ඇසුරු කලේ නම් හෝ ඔබ නිසා එම රෝගය ව්‍යාප්ත නොවන බවට පිළිගත් වෛද්‍යවරයකුගෙන් ලබාගන්නා ලද වෛද්‍ය සහතිකයක් නේවාසික වීම සඳහා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුවේ.
- ශාලා ගාස්තු:-
    - ❖ ඔබ නේවාසික පහසුකම් ලබාගැනීමට පෙර අදාල ශාලා ගාස්තුව (අධ්‍යයන වර්ෂයක් සඳහා ශාලා ගාස්තු ලෙස රු 750/- මුදලක්ද, සාමාසිකයක් සඳහා ශාලා ගාස්තු ලෙස රු 375/-ක්ද) පේරාදෙණිය මහජන බැංකුවේ අංක 057100121338023 ගිණුමට හෝ ලංකා බැංකුවේ අංක 0001273343 දරණ ගිණුමට බැර කර ආදාළ රිසිට්පත පූර්ණ කාලීන උප ශාලාධිපති වෙත ඉදිරිපත් කිරිමෙන් පමණක් නේවාසික පහසුකම් ලබා ගත හැක.
- නේවාසිකවීම සඳහා පැමිණෙන විට රැගෙන ආ යුතු භාණ්ඩ:-
    - ❖ සුදු පැහැති පිගානක්, සුදු පැහැති කෝප්පයක්, වතුර බොන වීදුරුවක්(plain), කොට්ට උරයක් සහ කොට්ටයක්, ඇඳ ඇතිරිලි, ඉබි යතුරු (අවශ්‍ය නම්) රැගෙන ආ යුතු වේ.
- නේවාසික පහසුකම් සැපයීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද ලිපියේ පළමුවන පිටුවේ ඉහළ දකුණු කෙළවරෙහි දක්වා ඇති ඔබගේ ලියාපදිංචි අංකය කාර්යාලය සමග කරන සියළුම ලිපි කටයුතු වලදී මෙන්ම ගෙවීම් වවුචර් පත්වලද සඳහන් කළ යුතුය

**2.නේවාසික පහසුකම් ආපසු බාරදීම.**

- නේවාසික පහසුකම් සැපයීමට අදාළ ලිපිය නිකුත්වීමෙන් පසු සතියක(දින 7ක් නිවාඩු දින ඇතුළුව) කාලයක් තුළ අදාල නේවාසික පහසුකම් ලබානොගන්නේ නම් පෙර දැනුම්දීමකින් තොරව අදාළ නේවාසික පහසුකම් අවලංගු කරනු ලැබේ.
- තම අභිමතය පරිදි ශාලා මාරු කිරීම හෝ තම ශාලා පහසුකම් වෙනත් අයෙකුට පැවරීමේ හෝ අයිතියක් කිසිදු ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට නොමැත.
- ශාලාවෙන් ඉවත්වන්නේ නම් සතියකට පෙර ඒ බව ශාලාධිපති/ශාලාධිපතිනිය මගින් අධ්‍යක්ෂ නේවාසික පහසුකම් වෙත දැනුම්දිය යුතුය. එවැනි අවස්ථාවකදී කුමන හේතුවක් නිසාවත් එම අධ්‍යයන වර්ෂයේ ඉදිරි කාලය තුලදී එම ශාලාවේ හෝ වෙනත් ශාලාවක නේවාසික පහසුකම් සපයනු නොලැබේ.
- ශාලාධිපති/ශාලාධිපතිනියගේ හෝ ඔහු විසින් නම් කරන ලද නිලධාරියෙකුගේ හෝ පූර්ව අනුමැතියකින් තොරව කිසිදු ආගන්තුකයෙකුට හෝ වෙනත් සිසුවෙකුට තම කාමරවල නවාතැන් පහසුකම් සැලසීම සම්පූර්ණයෙන්ම තහනම් ය.
- විශ්වවිද්‍යාලය මගින් දැනුම්දීමක් කළ විටක දී සිසුන් නේවාසික ශාලාවලින් අනිවාර්යයෙන්ම බැහැර විය යුතුය. එබඳු අවස්ථාවක දී හෝ අධ්‍යයන වර්ෂයක් අවසානයේ දී ශාලාවෙන් ඉවත්වන විට සිසුන් තමන් වෙත භාර දී ඇති උපකරණ හා කාමර යතුරු ආදිය නියමිත පරිදි භාරදිය යුතුය. නියමිත දිනට එසේ බාරදීමට අසමත් වූ විටක දී දඬ මුදලකට යටත් කරනු ලැබේ. තවද කිසියම් භාණ්ඩයකට සිසුන් අතින් අලාභයක් සිදුවුවහොත් ඒ සඳහා ඇස්තමේන්තු කරන ලද පිරිවැය අයකරගනු ලැබේ.අලාභහානි සඳහා දඩ මුදල් **3,5** යටතේ දක්වා ඇත,
- කාමර සඳහා අතිරේක යතුරු කැපීම නොකළ යුතුය. එමෙන්ම දොර අගුලු මාරු කරනු ලැබුවහොත් ඒ සඳහා දඩුවම් වශයෙන් දඩමුදල් අයකරනු ලැබේ.

**3. නේවාසිකාගාර හා සම්බන්ධ මූලික නීති සහ රෙගුලාසි.**

නේවාසිකාගාර පාලනය හා ශාලා විනය සම්බන්ධ නීති හා රෙගුලාසි පිළිබඳ සිසුන් දැනුවත්ව සිටිය යුතුය.මෙම නීති හා රෙගුලාසි නොදැන සිටීම නිදහසට කරුණක් ලෙස සලකණු නොලැබේ. ශාලා විනය හා පරිපාලනය සම්බන්ධ පූර්ණ බලධරයා වන්නේ ශාලාධිපති වන අතර ශාලාධිපති නොමැති අවස්ථාවල පූර්ණ කාලීන උප ශාලාධිපතිගේ උපදෙස් හා නියෝග සිසුන් විසින් පිළිපැදීම අනිවාර්ය වේ.

**3.1.ශාලා විනය:-**

- සෑම නේවාසිකයෙකුම සෑම විටම තම සන්තකයේ ශිෂ්‍ය හැඳුනුම්පත හෝ ශිෂ්‍ය වාර්තා පොත තබාගැනීම අනිවාර්ය වේ. එමෙන්ම අවශ්‍ය අවස්ථාවල ශාලාධිපති, උපශාලාධිපති හෝ වෙනත් බලය පැවරුණ නිලධාරියෙකු ඉල්ලා සිටි විට ඉදිරිපත් කළ යුතු වේ.
- කිසිම ශිෂ්‍යයෙකු විසින් මත්පැන් හා වෙනත් හානිකර මත්ද්‍රව්‍යයක් ශාලාවට හෝ එහි සීමාව තුළට හෝ නොගෙන ආ යුතුය. ශාලාව තුළ පානය නොකළ යුතුය. ළඟ තබා ගැනීම නොකළ යුතුය. එමෙන්ම පිටතදී මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතාකර ශාලාවට නොපැමිණිය යුතුය.

- රාත්‍රි 22.00 පැයෙන් පසු ශාලා භූමිය තුළ දැඩි නිශ්ශබ්දතාවක් ආරක්ෂා කළ යුතුය. සිසුන් අතර සිදුවන අධ්‍යයන සාකච්ඡා අනෙකුත් සිසුන්ට බාධාවක් හෝ අපහසුතාවක් හෝ ඇති නොවන පරිද්දෙන් සිදුකළ යුතුය.
- කාමර තුළ භාවිත කරන ශ්‍රව්‍ය උපකරණවල(ගුවන් විදුලි යන්ත්‍ර වැනි) ශබ්දය කාමරයට සීමා විය යුතුය.
- විශ්වවිද්‍යාල සිසුන් වශයෙන් තමන්ගේ සහ විශ්වවිද්‍යාලයේ ගරුත්වය රැකෙන පරිදි ශාලාව තුළ හා ශාලාවෙන් පිටත මනාව හැඳ පැළඳ සිටිය යුතුය.
- ශිෂ්‍ය සේවා අංශයේ ලියාපදිංචි කර නොමැති කිසිම සංගමයකට නේවාසිකාගාරක් තුළ රැස්වීමක් පැවැත්වීමට අවසර නොලැබේ. එමෙන්ම ශාලාධිපතිගෙන් හෝ ඔහු විසින් බලය පවරන නිලධාරියෙකුගෙන් හෝ ලබාගත් ලිඛිත අවසරයකින් තොරව ශාලාවක් තුළ කිසිම සංගමයක් ස්ථාපනය කළනොහැකිය.
- කාමරතුළ ආහාර පිසීම සපුරා තහනම් වේ.
- ශාලා තුළ දැන්වීම් ප්‍රදර්ශනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අතුරු නීතිජේද 26 ට අනුකූල විය යුතුය.
- ශාලා කාමර වල ජනේලවලින් අපද්‍රව්‍ය ඉවතට විසි කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

**3.2. ශාලා උපකරණ හා විදුලි උපාංග භාවිතය:-**

- ශාලාවේ පොදු ස්ථානවල හා කාමර තුළ ඇති ලී භාණ්ඩ හා උපකරණවලට අලාභහානි නොකළ යුතුය,
- ශාලාවේ පොදු ස්ථානවල හා කාමර තුළ ඇති ලී භාණ්ඩ හා උපකරණ අවසරයකින් තොරව ගෙනයාම හෝ මාරුකිරීම හෝ නොකළ යුතුය.
- පෞද්ගලික විදුලි භාණ්ඩයක් භාවිත කිරීමේදී ශාලාධිපති හෝ ඔහු විසින් නම් කරන ලද නිලධාරියෙකුගේ හෝ අවසර ලබාගත යුතුය. අමතර විදුලි උපකරණ භාවිත කිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාල බලධාරින් විසින් තීරණය කරනු ලබන අමතර ගෙවීමක් කළ යුතු වන්නේය.
- කාමරවල සවිකර ඇති විදුලි උපකරණ හා විදුලි ඇනවුම්(Plug & Switch) ගැලවීම හෝ වෙනස් කිරීම හෝ සිදුනොකළ යුතුය. ඒ පිළිබඳ ගැටලුවක් පවතී නම් ශාලා පරිපාලනය දැනුවත් කළයුතුය. අවශ්‍යතාව පරිදි Adaptor හා Extension code භාවිතා කළ හැකිය.

**3.3. ආපන ශාලාව:-**

- පිරිමි ශාලීය ආපන ශාලාවන් උදෑසන 6.30 සිට රාත්‍රි 11.00 දක්වාත් කාන්තා ශාලීය ආපන ශාලාවන් උදෑසන 6.00 සිට රාත්‍රි 10.00 දක්වාත් විවෘතව තබනු ඇත. තේ ලබාදීම දිවා හා රාත්‍රී ආහාර ලබාදෙන අවස්ථාවල නොකෙරෙන අතර

  උදෑසන ආහාරය පෙ. ව. 6.30 - 8.30 අතර

  දිවා ආහාරය පෙ.ව. 11.30 - 1.30 අතර

  රාත්‍රි ආහාරය (පිරිමි නේවාසිකාගාරවල) ප.ව 6.30 - 9.00 දක්වා වන අතර රාත්‍රි ආහාරය (කාන්තා නේවාසිකාගාරවල) ප.ව 5.30 - 9.00 දක්වාලබාදෙනු ඇත
- ආපන ශාලාව සතු පිඟන්, වීදුරු, කෝප්ප හා පිරිසි කාමර තුළට ගෙන යාම නොකළ යුතුය. එසේ කරනු ලැබුවහොත් දඩ මුදලක් අයකරනු ලැබේ.

**3.4. නේවාසිකත්වයෙන් බැහැර වීම:-**

- ශාලාධිපති හෝ උපශාලාධිපති විසින් නිකුත් කල අවසර පත්‍රයක් නොමැතිව ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට පෙ.ව 6.00 ට පෙර ශාලාවෙන් බැහැර යා නොහැක. එසේම සියලුම ශිෂ්‍ය/ශිෂ්‍යාවන් රාත්‍රී 7.30 පෙර නේවාසිකාගාරයට ආපසු පැමිණිය යුතුය.(එහෙත් සියලුම පළමු වසර ශිෂ්‍ය/ශිෂ්‍යාවන් පෙ.ව 7.00 ට පෙර ශාලාවෙන් බැහැර නොයා යුතු අතර ප.ව 6.00 වන විට අදාල නේවාසිකාගාර වලට පැමිණිය යුතුය)
- ශාලාධිපති/පතිනියගෙන් හෝ අදාළ වෙනත් බලධාරියකුගෙන් අවසර නොලබා එක් දිනක් හෝ ඊට වැඩි කාලයක් ශාලාවෙන් බැහැරව සිටීම ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විසින් නොකළ යුතුය. ඔබට ශාලාවෙන් බැහැරව සිටීමට අවශ්‍ය නම් මෙහි පහත දැක්වෙන ක්‍රමය අනුගමනය කරන්න.

(අ) සති අන්ත නිවාඩු ශාලාධිපති/පතිනියගෙන් ද.

(ආ) අධ්‍යයන කටයුතු අඩාල වීමට බලපාන දින 07 දක්වා වූ කාලය සඳහා නම් ශාලාධිපති/පතිනියගේ මාර්ගයෙන් අදාළ පීඨාධිපතිගෙන් ද,

(ඇ) දින 07 කට වැඩි කාලයක් නම් ශාලාධිපති/පතිනිය හා අදාළ පීඨාධිපති මගින් උපකුලපතිතුමන්ගෙන් ද නිවාඩු ලබාගත යුතුය.

**3.5.ශාලා ගාස්තු හා ශාලා දේපලවලට කරනු ලබන අලාභහානි සඳහා දඩ මුදල් :-**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය කමිටු තීරණවලට අනුව ශාලා ගාස්තු හා ශාලා දේපලවලට කරනු ලබන අලාභහානි සඳහා පහත සඳහන් දඩ මුදල් අය කරනු ලැබේ.

i. **ප්‍රමාද ගාස්තු** :-

- අධ්‍යයන වර්ෂයක් සඳහා නේවාසික පහසුකම් ලබාගැනීමට රු 750/- ක මුදලක්ද, එක් සාමාසිකයක් සඳහා නේවාසික පහසුකම් ලබාගන්නේනම් රු 375/- ක මුදලක්ද, අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු කාලය තුලදී සති 02 කට වඩා වැඩි කාලයක් නේවාසිකව සිටිනම් රු 375/- මුදලක්ද, ශාලා ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. නේවාසික පහසුකම් ලබා සති 02 ක් ගතවනතුරුත් ශාලා ගාස්තු ගෙවා නොමැතිනම් අදාළ ගාස්තුව හා සමාන මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස අයකරනු ලැබේ.

- අධ්‍යයන වර්ෂය අවසානවනතුරුත් අදාල ශාලා ගාස්තු ගෙවා නොමැති සිසුන්ට නැවත නේවාසික පහසුකම් ලබා ගැනීමේ හිමිකම අහිමිවනු ඇත.

- නියමිත දිනට කාමර යතුර සහ කාමරයට අයත් භාණ්ඩ නිත්‍යානුකූලව භාර නොදෙන සිසුන් සඳහා රු 3000/- ක ප්‍රමාද ගාස්තුවක් අය කෙරේ.

ii. **අලාභහානි සඳහා දඩමුදල්** :-

- ගෘහ භාණ්ඩ පූර්ණ අලාභහානියකදී භාණ්ඩයේ වටිනාකම+ වටිනාකමින් 25% (සේවා ගාස්තු) අය කෙරේ.
- ගෘහ භාණ්ඩ පූර්ණ නොවන අලාභහානි සඳහා හානිය තක්සේරු කර දඩ මුදල් නියම කෙරේ. (අලාභහානිය 1000/ වඩා වැඩිනම් පහත අංක ii.i බලන්න)
- මෙට්ට පූර්ණ අලාභහානියකදී මෙට්ටයේ වටිනාකම+ වටිනාකමින් 25% (සේවා ගාස්තු) අය කෙරේ.

- මේට්ට වලට කරනු ලබන පූර්ණ නොවන අලාභහානි සඳහා හානිය තක්සේරු කර දඩ මුදල් නියම කෙරේ.
- විදුලි උපකරණ අලාභහානි සඳහා විදුලි උපකරණයේ වටිනාකම+ වටිනාකමින් 25% (සේවා ගාස්තු) අය කෙරේ..
- ක්‍රිඩා භාණ්ඩ අලාභහානි සඳහා ක්‍රිඩා භාණ්ඩයේ වටිනාකම+ වටිනාකමින් 25% (සේවා ගාස්තු) අය කෙරේ.
- ජනෙල් දොරවල් වලට කරනු ලබන අලාභහානි සඳහා හානිය තක්සේරු කර දඩ මුදල් නියම කෙරේ..

ii.i, පහත දක්වා ඇති අලාභහානි සඳහා වැඩ ඉංජිනේරු මහතා ලවා පූර්ණ කාලීන උපශාලාධිපති විසින් ඇස්තමේන්තු ලබාගෙන දඩ මුදල් අය කරනු ලැබේ.
- ජනෙල් දොරවල් වලට සහ ගෘහ භාණ්ඩ වලට රු 1000/-ට වඩා වැඩි අලාභහානි කිරිම් සහ,
- කාමරයේ ඇතුලත හා පිටත බිත්ති සහ ඒවාට සවිකර ඇති උපකරණවලට අලාභහානි කිරිම,

iii,. පහත දක්වා ඇති ක්‍රියාවන් සඳහා පූර්ණ කාලීන උපශාලාධිපති විසින් ශාලාධිපතිගේ එකගතාවය මත අයකිරිම් කරනු ලැබේ,
- කාමරය අපිරිසිදු කිරිම,
- ශාලා පරිශ්‍රය තුල සිදුකරනු ලබන විනය විරෝධි ක්‍රියාවන්

එසේම සියලුම දඩ මුදල් කාමරයේ සිටින ශිෂ්‍ය/ශිෂ්‍යයාවන් අතර සමානව බෙදියන අතර පෞද්ගලිකව කරනු ලබන හානි අදාල ශිෂ්‍යයා/ ශිෂ්‍යයාවගෙන් අය කරනු ලැබේ.

**3.6. නවක වදය:-**

- කුමන ආකාරයකින් හෝ නවක වදය තහනම් වන අතර, නවක සිසුන්ට හිංසා කිරිම සඳහා සංවිධානය වීමෙන් හෝ ඊට සහභාගි වීමේන් හෝ වලකින ලෙසට සිසුන්ට තදින් අවවාද කරනු ලැබේ. ඕනෑම හිංසාකාරි ක්‍රියාවක් රටේ පවත්නා නීතිය අනුව සාපරාධී ක්‍රියාවක් ලෙස සලකා ක්‍රියාකරනු ලැබේ. ඒ අනුව

i. යම් ශිෂ්‍යයෙකුට හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුට නවක වදය සිදුකිරිම, ලිංගික අතවරයක් හෝ බරපතල තුවාල සිදුකරන ඕනෑම තැනැත්තෙකු,

ii. අධ්‍යාපන ආයතනයක නම් ශිෂ්‍යයෙකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු තුල බිය ඇති කිරිමේ චේතනාව ඇතිව හෝ තර්ජිත තැනැත්තාට නීතියෙන් නියම කර නොමැති යම් ක්‍රියාවක් කරන ලෙස හෝ කිරිමට ඒ තැනැත්තාට අයිතිය තිබෙන ක්‍රියාවක් නොකරන ලෙස හෝ තර්ජිත තැනැත්තාට බලකිරිමේ චේතනාව ඇතිව ඒ අධ්‍යාපන ආයතනය තුළදී හෝ ඉන් පිටතදී හෝ ඒ ශිෂ්‍යයාගේ හෝ කාර්ය මණ්ඩලයේ සමාජිකයාගේ ශරිරයට, කීර්තියට හෝ දේපලට, හානී සිදුකරන බවට, වාචිකව හෝ ලිඛිතව තර්ජනය කරන්නාවූ යම් තැනැත්තෙකු,

iii. යම් අධ්‍යාපන ආයතනයක් ඇතුලතදි හෝ ඒ අධ්‍යාපන ආයතනයේ කළමණාකරණය හා පාලනය යටතේ වූ යම් පරිශ්‍රයක් ඇතුලත දි නිත්‍යානුකූල යුක්ති සහගත භාවයකින් තොරවද, යම් විශේෂ ක්‍රියා මාර්ගයක් ගැනිමට ඒ අධ්‍යාපන ආයතනයේ යම්ශිෂ්‍යයෙකුට, එහි කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට හෝ වෙනත් තැනැත්තෙකුට බලකිරිමේ කාර්යය සඳහාද, ඒ ශිෂ්‍යයාගේ හෝ කාර්ය මණ්ඩලයේ සමාජිකයාගේ හෝ වෙනත් තැනැත්තෙකුගේ හෝ පෞද්ගලික නිදහස සහ යාම ඊමේ නිදහස අවහිර කරන්නාවූ යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තෙකු,

iv. අධ්‍යාපන ආයතනයක යම් ශිෂ්‍යයෙකු හෝ කාර්ය මණ්ඩලයේ සමාජිකයෙකුගේ ඇතැම් පරිමිත සීමාවලින් ඔබ්බට යාම වලක්වන යම් ආකාරයකින් ඒ ශිෂ්‍යයාට හෝ සමාජිකයාට නීති විරෝධී ලෙස අවහිර කරන යම් තැනැත්තෙකු,

v. අධ්‍යාපන ආයතනයකට අයත් වන්නාවූ හෝ එහි කළමණාකරණය හෝ පාලනය යටතේ පවත්නා හෝ යම් පරිශ්‍රයක, නීත්‍යානුකූල හේතුවක් නොමැතිව, බලහත්කාරයෙන් පදිංචිවන්නාවූ යම් තැනැත්තෙකු,

vi. අධ්‍යාපන ආයතනයකට අයත් වන්නාවූ හෝ එහි කළමණාකරණය හෝ පාලනය යටතේ පවත්නා යම් දේපලක් සම්බන්ධයෙන් අනර්ථයක් සිදුකරන යම් තැනැත්තෙකු,

1998 අංක 20 දරණ අධ්‍යාපන ආයතනවල නවක වදය හා වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත යටතේ වරදකරුවෙකු වන්නෙකු ඇප ලබාදිය නොහැකි මට්ටමේ වරදක් වන අතරම, වසර 2 සිට 20 දක්වා බරපතල වැඩ සහිත සිර දඬුවම් ලබාදිය හැකිය. එමෙන්ම ආයතනයෙන් නෙරපිය හැකි අතරම, ඊට ගොදුරු වූ තැනැත්තාට ශාරීරික හො දේපල හානි සිදුවූයේ නම් ඒ සඳහා වන්දි ගෙවිය යුතුය.

ඉහත දක්වා ඇති කොන්දේසිවලට අමතරව විශ්වවිද්‍යාලය විසින් නේවාසික පහසුකම් හා එයට සම්බන්ධ කටයුතුවලට කලින් කලට නිකුත් කරනු ලබන නීති හා රෙගුලාසින්ට යටත්ව කටයුතු කිරීමටත්, මනා පැවැත්මක් හා විනයෙන් යුතුව හැසිරීමටත්, සියලු ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වගබලා ගතයුතුය. එම කොන්දේසි හා විනය නීති උල්ලංඝනය කරනු ලැබුවහොත් නේවාසික පහසුකම් අවලංගු කිරීමට හා වෙනත් විනයානුකූල දඬුවම් ලැබීමට හේතු වේ.

තවද, ඉහත දක්වා ඇති නීති හා කොන්දේසිවලට යටත්ව නේවාසික පහසුකම් ලැබීමට ඔබ එකඟ වන්නේ නම්, ඒ බවට මේ සමඟ එවා ඇති ප්‍රකාශනය නිසි අයුරු සම්පූර්ණ කොට ඔබගේ ජායාරූපයක් වෙන්කර ඇතිකොටුවෙහි අලවා, අත්සන තබා ඔබ ශාලාවෙහි ශාලාධිපති / ශාලාධිපතිනිය හෝ උපශාලාධිපති / උප ශාලාධිපතිනිය වෙත භාර දී නේවාසික පහසුකම් ලබාගන්නා ලෙස වැඩිදුරටත් දන්වමි.

එස් වික්‍රමසිංහ
වැ.බ අධ්‍යක්ෂ,
ශිෂ්‍ය නේවාසික පහසුකම් අංශය,
පේරාදෙනිය විශ්වවිද්‍යාලය.